12(1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022.12.23 |

පැමිණිලි පාර්ශවය : එම්.එම්.ඩී.ජී බණ්ඩාර මයා,
පොල්අතුවාඩිය,
අතරගල්ලෑව,
මාතලේ.

වගඋත්තර පාර්ශවය : 01. අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
කොළඹ 01.

02. අධ්‍යක්ෂ,
කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය,
මොරගහකන්ද.

<u>පැමිණිලි අංකය : **HRC/3908/16**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 33(1) අනුව 'ගිණුම් සහකාරවරු' ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ ඩී 3 කාණ්ඩය යටතේ පැවැති අතර, පසුව නිකුත් කළ 2016/01 චක්‍රලේඛය මගින් ගිණුම් සහකාරවරු සහය කාර්ය මණ්ඩලය යටතට දැමීම තුළ අධ්‍යාපන, පළපුරුද්ද හා තනතුර පහළ වැටීම හේතුවෙන් ඇඩි වැටුප් විෂමාතාවයන් ඇති වූ බවයි. නව චක්‍රලේඛය මගින් ව්‍යාපෘති ගිණුම් සහකාර තනතුර පහළ සහය කාර්ය මණ්ඩලයට යෙදීම තුළ සිදුවන අසාධාරණයට පිළියමක් ලෙස එම තනතුර 'ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ පී එස් 06 මට්ටමට' ගෙන ඒම මෙම පැමිණිල්ලෙන් අපේක්ෂා කරන බවද දන්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

උක්ත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් 1 වන වගඋත්තරකාර, අධ්‍යක්ෂ ජනරාල් කළමණාකරණසේවා දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇත්තේ, ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 33 වෙනුවට 2016.03.24 දිනැතිව 01/2016 කළමණාකරන සේවා චක්‍රලේඛය නිකුත් කර ඇති අතර, එහි පී එස් 01-06 කාණ්ඩ යටතේ කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 33 ට වඩා ඉහළ අගයකින් වැටුප් වැඩිකර දක්වා ඇති බවයි. එසේම ඒ ඒ කාණ්ඩ යටතේ අදාළ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද වෙන් වෙන් වශයෙන් දක්වා ඇති අතර, මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2014.06.10 වන දිනැතිව කාර්ය මණ්ඩලය අනුමත කිරීමේදී ගිණුම් සහකාර තනතුර ඩී කාණ්ඩය යටතේ දක්වා ඇති බවත්, අනතුරුව 2016.05.11 දිනැතිව 01/2016 දරණ නව චක්‍රලේඛය යටතේ කාර්ය මණ්ඩලය අනුමත කිරීමේදී එම තනතුර සහය කාර්ය මණ්ඩලය යටතට ගෙන ඇති බවත් දක්වා ඇත.

මෙහිදී විවිධ තනතුරු දරන්නන්ට ඇති වූ විෂමතා සම්බන්ධයෙන් එම ව්‍යාපෘතියෙන් දැනුම්දීමක් කර ඇති අතර, එයට පිළිතුරු ලෙස 2016.09.01 දිනැතිව අංක ඩීඑම්එස්/7777/මොර.කළු ගඟ ලිපියෙන් සුදුසු අයුරින් සහන සැළසීමට දන්වා ඇති බවද, කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 30 හි ඩී කාණ්ඩය යටතේ වැටුප් ලැබූ නිලධාරීන්ට නව චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමේදී වැටුප් අඩුවීමක් සිදුවන්නේ නම්, පෙර පැවැති ක්‍රමවේදය අදාළ කරගැනීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවද දන්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ වැටුප නව චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩල අනුමත කිරීමේදී යම් අඩුවීමක් සිදුවී ඇත්නම් කළමණාකරණ චක්‍රලේඛ 33 යටතේ ගෙවමින් පවතින වැටුප හා ඊට අදාළ වැටුප් වර්ධක ලබාදීමේ හැකියාව ව්‍යාපෘතිය සතු වේ. 1 වන වගඋත්තරකරු විසින් තවදුරටත් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුගේ ගැටළුව නිරාකරණය නොවන්නේ නම් පැමිණිලිකරුගේ සුදුසුකම් 01/2016 චක්‍රලේඛය පීඑස්-06 කාණ්ඩයට අදාළ අධ්‍යාපන හා පළපුරුද්දට අදාළ සුදුසුකම් හා සැසඳෙන්නේ ද යන්න පරීක්ෂා කර බලා ඒ හා සැසඳෙන්නේ නම් පැමිණිලිකරුට පුද්ගලික වන සේ පීඑස්-06 කාණ්ඩයේ රැඳවීම සඳහා සලකා බැලිය හැකි බවයි.

**නිරීක්ෂණ :-**

01/2016 චක්‍රලේඛයේ පීඑස්-06 කාණ්ඩයට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පැමිණිලිකරු විසින් සපුරා තිබේද යන්න පරීක්ෂා කර බලා ඒවා සැසඳෙන්නේ නම් පැමිණිලිකරුට පුද්ගලික වන සේ පීඑස්-06 කාණ්ඩයේ ස්ථානගත කළ හැකි බව 01 වන වගඋත්තරකරුගේ ස්ථාවරය වේ. එබැවින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර අදාළ සුදුසුකම් පැමිණිලිකරු සම්පූර්ණ කර ඇත්නම් පැමිණිලිකරුට පුද්ගලික වන සේ පීඑස්-06 කාණ්ඩයට පිහිටුවා හිඟ වැටුප් ද සහිතව අදාළ හිමිකම ලබාදීම සුදුසු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

නිර්දේශය :-

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින්, 01/2016 චක්‍රලේඛය ප්‍රකාරව පැමිණිලිකරුගේ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පරීක්ෂා කර බලා ඒවා ඊට සැසඳේ නම්, පැමිණිලිකරු පීඑස් 06 කාණ්ඩයට අන්තර්ග්‍රහණය කර හිඟ වැටුප් ද ලබා දීමට පියවර ගත යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : අමාත්‍යතුමා,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
500, ටී. බී ජයා මාවත,
කොළඹ 10.

B/